# ශ්‍රී ලංකාවේ සත්ත්ව නිෂ්පාදන

මිනිසා බිහිවූ ද පටන් ම සත්වයින් සිය ජීවනෝපායට සහාය කරගත් බව ඉතිහාසයෙන් පෙනේ. විශේෂයෙන් එඬේරා යුගයේදී මිනිසා මුළුමනින්ම සිය ජීවනෝපාය සපයාගත්තේ සත්ව පාලනයෙන්ය. කල්යත්ම මිනිසාට සත්ව සම්පතේ අගය සහ, ප්‍රයෝජනවත් බව තව තවත් වැටහී ගියෙන් එම ක්ෂෙත්‍රය ලොව පුරා පැතිරී ව්‍යාප්ත වීමෙන් විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුවක් ලැබීය. ලොව පුරා ඇති ඓතිහාසික සාක්ෂි අනුව ප්‍රාග් ඉන්දීය ජනයා චිරාත්කාලයක් සත්ව පාලනයේ වැදගත්කම හා ප්‍රයෝජනවත් භාවය ගැන අවබෝධ කර ගෙන සිටියහ. ''මහා භාරතයේ'' සඳහන් වන පරිදි ''ඔවුන්ගේ කිරෙන් සහ එයින් සාද ගන්නා පස්ගෝ


පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

## ටී. ඒ. ධර්මරත්න

විසිනි


රසයෙන් විශ්වයේ සියළු සත්වයෝ පෝෂණය වෙති.'' යන අදහසින් එම සම්පත කෙතෙක් අගයන ලදදැයි වැටහේ.

ශ්‍රී ලංකාවේ සත්ව පාලන කටයුතු පිළිබඳව වාර්තා වන්නේ ලංකා ඉතිහාසයේ මුල් යුගය වූ ක්‍රිස්තු පූර්ව 500 පමණ කාලයේදී ය. උතුරු ඉන්දිය ප්‍රදේශ වලින් මෙරටට පැමිණි මුල් කාලීන ජනපදිකයන් බොහෝ දුරට සී සෑමටත් කිරි හා ගිතෙල් ලබා ගැනීමටත් සත්ව පාලන කටයුතු කළ බව ඉතිහාසයේ සඳහන් වේ. කෙසේ වුවත් වර්තමාන ශ්‍රී ලංකාවේ සත්ව පාලන කටයුතු 19 වන ශත වර්ෂයේ මුල් භාගයේ සිට ක්‍රමවත්ව වර්ධනය වීමට පටන් ගත් බව පෙනේ. මෙයට මූලික හේතුව වූයේ මෙරටට ලැබුණු බටහිර ආර්ථිකමය ආභාෂය හා විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුවත් ය. අනික් අතට මේ සියවසේ මුල් භාගයේ සිට ඇති වූ ජනගහන වර්ධනය, සත්ව නිෂ්පාදන ආශ්‍රිත කිරි හා මස් බිත්තර ආදිය සම්බන්ධව පෝෂ්‍ය පදර්ථයන් පිළිබඳ වූ ප්‍රතිපත්තිමය දැනුම පුළුල් වීම ආදී කරුණු ද මේ සඳහා හේතු විය.

ශ්‍රී ලංකාවේ සත්ව පාලන නිෂ්පාදන සඳහා ඇති හැකියාවන් සහ ඉඩකඩ ප්‍රස්ථාවන් බොහෝය. කඳුරට ප්‍රදේශයේ ශීත කලාපීය රටවල ගව වර්ගයන් සඳහා ඉතා යෝග්‍ය පාරිසරික අවශ්‍යතාවයන් සපයන අතර විශාල පරිමාණ හා කුඩා පරිමාණ සත්ව ගොවිපලවල් සඳහා ඉතා අනර්ඝතම සහ යෝග්‍යතම ඉඩ ප්‍රස්ථාවන් සලසා දෙයි. වියලි කලාපීය බොහෝ ප්‍රදේශයන් ඉන්දියානු ගව වර්ග හා වෙනත් ආසියාතික රටවල ගව වර්ග වලට හා දේශීය වර්ග සඳහා සුදුසු පරිසරයක් පවතී. මීට අමතරව පුත්තලම, ආනමඩුව මන්නාරම, හම්බන්තොට, මඩකලපුව, යාපනය සහ වෙනත් වෙරළබඩ ආශ්‍රිත ශුෂ්ක දේශගුණික රටාවක් ඇති ප්‍රදේශයන් මෙරට එළුවන් සඳහා ඉතාම යෝග්‍ය පාරිසරික අවශ්‍යතාවයන් සපයා දෙයි. එසේම ඌරන් සහ කුකුල් පාලන කටයුතු සඳහා පාරිසරික හා භෞතික සහ ආර්ථික සාධක රැසක් දිවයින පුරාම පැතිරී පවතී. එසේ වුවත් මේ නිෂ්පාදන සඳහා හොඳ වෙළඳපොලක් ලබා ගත හැක්කේ බටහිර සහ දකුණු ප්‍රදේශයත්, මධ්‍යම ප්‍රදේශයත් මුල් කරගෙනය. දැනට මෙම කුකුල් හා ඌරු පාලන කර්මාන්තය යම් වර්ධනයක් වී ඇත්තේ ද දිවයිනේ අගනුවර මුල් කොටගත් නාගරික ප්‍රදේශය, බටහිර හා දකුණු ප්‍රදේශයත්, මධ්‍යම ප්‍රදේශය හා යාපන අර්ධද්වීපයත් තුළය. පාරිසරික යෝග්‍යතාවයත් තවත් සමාජීය ආර්ථික හේතු රැසක් මුල් කරගෙන පසු ගිය තිස්වසරක කාලය තුළ පොදු වශයෙන් ශ්‍රී ලංකාවේ සත්ව පාලන කටයුතු වල වර්ධන උපනතියක් පෙන්නුම් කරනු ලැබීය. 1962 සිට 1982 දක්වා කාල පරිච්ඡේදය තුළ දී දිවයිනේ ප්‍රධාන සත්ව වර්ගයන් වර්ධනය වූ ආකාරය පහත සඳහන් සටහන පෙන්නුම් කරයි.

| සත්ව වර්ගය | 1962 | 1973 | 1982 |
|---|---|---|---|
| 1. එළ ගවයින් | 13,63,785 | 10,16,173 | 16,98,600 |
| 2. මී ගවයින් | 5,69,481 | 3,84,336 | 8,79,200 |
| 3. බැටළුවන් | — | 17,891 | 28,000 |
| 4. එළුවන් | 88,283 | 2,90,611 | 5,11,600 |
| 5. ඌරන් | 50,184 | 47,254 | 75,100 |
| 6. කුකුළන් | 37,65,239 | 38,30,171 | 62,48,500 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1962 සිට 1982 දක්වා ඇති කාලය තුළ ඉහත සඳහන් සටහනට අනුකූලව එක් එක් සත්ව බාණ්ඩ වල සංඛ්‍යාත්මක වශයෙන් වර්ධනඋපනතියක් පෙන්නුම් කළත් ඇත්ත වශයෙන්ම මෙම එක් එක් සත්ව බාණ්ඩය ගත හොත් ඒ පිළිබඳව සත්ව නිෂ්පාදන අංශයෙන් සැලකිය යුතු සහ ප්‍රමාණවත් පරිදි නිෂ්පාදනයක් හෝ සංවර්ධනයක් වී නැති බව කිව හැකිය. කෙසේ නමුත් ගත වූ තිස්වසරක කාලය තුළ සත්ව පාලන ක්ෂෙත්‍රයේ සිදු වූ වර්ධනයට අනුකූලව මේ ආශ්‍රිතව සත්ව නිෂ්පාදනයන්ගෙන්ද වර්ධනයක් සිදු විය. එය පහත සටහන පිළිබිඹු කරයි.

**1962, 1973 සහ 1982 යන වර්ෂවල ශ්‍රී ලංකාවේ සත්ව නිෂ්පාදන**

| | සත්ව නිෂ්පාදන | 1962 | 1973 | 1982 |
|---|---|---|---|---|
| 1. | එළකිරි බෝතල් | 86,90,020 | 1,50,23,800 | 2,56,55,100 |
| 2. | මී කිරි (බෝතල්) | 24,04,319 | 37,69,600 | 77,28,000 |
| 3. | උණුකොට විෂ නසන ලද කිරි (ලීටර් දහස්) | 7,981 | 12,587 | 12,016 |
| 4. | විෂ නසනලද කිරි (ලීටර් දහස්) | 634 | 3,886 | 9,443 |
| 5. | උකු කිරි (ටින් දහස්) | — | 17,934 | 10,800 |
| 6. | වියලන ලද කිරි පිටි (කි.ග්‍රෑ. දහස්) | — | 65 | 3,644 |
| 7. | බටර් (කි.ග්‍රෑ. දහස්) | — | 167 | 162 |
| 8. | බිත්තර (දශලක්ෂ) | 204 | 446 | 521 |
| 9. | මස් (මෙට්‍රික් ටොන්) | 14,705 | 17,260 | 12,442 |
| 10. | එළු මස් (මෙට්‍රික් ටොන්) | 1,233 | 1,244 | 1,363 |
| 11. | ඌරු මස් (මෙට්‍රික් ටොන්) | 584 | 612 | 885 |

මූලය ශ්‍රී ලංකා මහ බැංකුව



**කිරි, සතුන්ගෙන් ලැබෙන එක් සම්පතක්**

පසු ගිය තිස්වසරක කාලය තුළ මෙරට සත්ව නිෂපාදන අංශයෙන් මේ ලැබුණු නිෂපාදන ධාරිතාවය රටේ අවශ්‍යතාවයන් සපුරාලීමට කිසිසේත් ප්‍රමාණවත නොවීය. මේ නිසා දේශීය සත්ව නිෂ්පාදන ආහාර ද්‍රව්‍යයන් ප්‍රමාණවත් පරිදි ජනතාවගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට නොහැකි වූයෙන් එම නිෂපාදනයන් අනිවාර්යෙන්ම ආනයනය කිරීමට රජයට සිද්ධ විය. ඒ නිසා පසු ගිය කාලය තුළ දශක 3ක් අතර දී මෙරටට ආනයනය කළ සත්ව නිෂපාදන ආහාර ද්‍රව්‍යවයන් වල ප්‍රමාණය හා වටිනාකම පහත සටහන නිරූපනය කරයි.

**1962, 1973 සහ 1983 වර්ෂවල මෙරටට ආයාත කරනු ලැබූ සත්ව නිෂ්පාදන ආහාර ද්‍රව්‍ය වල ප්‍රමාණය හා වටිනාකම**

| වර්ෂය | | කිරි නිෂ්පාදනයන් කිරි, පිටි. කිරි, ක්‍රීම්. බටර්, චීස් ආදි සියල්ලමගේ එකතුව | මස් නිෂ්පාදන යන් මස් සහ සකස්කළ මස් වර්ග සියල්ල |
|---|---|---|---|
| 1962–ප්‍රමාණය–මෙට්‍රික් ටොන් | ... | 18,859.4... | 958.7 |
| වටිනාකම රුපියල් දශලක්ෂ | | 54.36... | 2.90 |
| 1973–ප්‍රමාණය–මෙට්‍රික් ටොන් | ... | 1,1374.7... | 0.6 |
| වටිනාකම–රුපියල් දශලක්ෂ | ... | 70.2... | 0.06 |
| 1982–ප්‍රමාණය–මෙට්‍රික් ටොන් | ... | 12,086.9... | 4634. |
| වටිනාකම–රුපියල් දශලක්ෂ | ... | 481.5... | 30.7 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ඉහත සදහන් ලේඛණ සටහනට අනුව හෙළි වන්නේ දැනට ලංකාවේ සත්ව නිෂපාදන ආහාර ද්‍රව්‍ය සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටින් පිටවී යන බවයි. කෙසේ නමුත් මෙයින් ගම්‍ය වන තවත් මූලික අදහසක් නම් අප තවමත් සත්ව නිෂපාදන ආහාර ද්‍රව්‍ය අතින් ඉතාමත් ප්‍රාථමික මට්ටමක පසු වන බවත් එහි වර්ධනයට හා දියුණුවට තවත් බොහෝ කටයුතු කළ යුතු බවත්ය. ශ්‍රී ලංකාවේ මුළු කෘෂිකාර්මික නිෂ්පාදන වටිනාකමින් 8%ක් සඳහා දයක වන්නේ සත්ව පාලන අංශයයි. සත්ව පාලන කටයුතු වලින් සීඝ්‍ර දියුණුවක් අපේක්ෂා කරන වර්ධනය වෙන රටක් වශයෙන් මෙම ප්‍රති ශතක ප්‍රමාණය කිසිසේත් ප්‍රමාණවත් නොවේ. මන්ද යත් කලාපීය අතින් රටවල් වශයෙන් පකිස්ථානය 18%ක්ද, පිලිපීනය 30%ක්ද මුළු කෘෂිනිෂ්පාදන වටිනාකමට සත්ව පාලන අංශයෙන් එක් කෙරෙයි. ශ්‍රී ලංකාවේ සත්ව පාලන කටයුතු තව තවත් වර්ධනය කිරීමට ඇති ඉඩකඩ බොහෝ බව පෙන්වා දිය හැකිය. කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ සත්ව පාලන කටයුතු දැනට ව්‍යාප්ත වී ඇත්තේ ඒ ඒ සත්ව බාණ්ඩවලට වඩාත් උචිත පාරිසරික දේශගුණ රටාව මුල් කරගෙනය. ඒ අනුව 1983 වන විට මෙරට සත්ව සම්පත දේශගුණික කලාපීය යෝග්‍යතාවන් අනුව විසිරී ඇති ආකාරය පහත සඳහන් සටහන පෙන්නුම් කරයි.

**ප්‍රධාන දේශගුණික කලාපයන් අනුව පශු සම්පත් ව්‍යාප්තිය**

| සත්ව වර්ගය | | | වියලි කලාපය | | අතරමැදි කලාපය | | තෙත් කලාපය (000'දහස්) | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| එළ ගවයන් | ... | ... | 995 | ... | 355 | ... | 338 | ... | 1688 |
| මී ගවයන් | ... | ... | 458 | ... | 239 | ... | 182 | ... | 879 |
| එළුවන් | ... | ... | 326 | ... | 80 | ... | 106 | ... | 512 |
| බැටළුවන් | ... | ... | 22 | ... | 5 | ... | 1 | ... | 28 |
| ඌරන් | ... | ... | 16 | ... | 15 | ... | 44 | ... | 75 |
| කුකුළන් | ... | ... | 2079 | ... | 1125 | ... | 3038 | ... | 6264 |

මූලය : ශ්‍රී ලංකා සත්ව පාලන සංඛ්‍යාව 1983

කිරි හා කිරි නිෂ්පාදනයන් ලබා ගැනීම ගැන මහජනයා දක්වන්නේ විශේෂ සැලකිල්ලකි. මිනිස් වර්ගයාට අවශ්‍ය ආහාර වල අඩංගු විය යුතු පෝෂ්‍ය පදර්ථ සියල්ලම වාගේ කිරිවල අඩංගු වේ. එනම් ප්‍රෝටීන්, මේද, ඛනිජ හා බොහෝ විටමින් වර්ග ද වේ. මේ නිසාම ශ්‍රී ලංකාවේ සත්ව නිෂපාදන අංශයේ ද ප්‍රධාන නිෂ්පාදන ද්‍රව්‍යයන් වන්නේ කිරිය. ඒ අනුව මුළු කෘෂි නිෂ්පාදිතයට 8% ක් එකතු කරන සත්ව පාලන අංශයෙන් 2%ක් එකතු කරන්නේ කිරි හා කිරි නිෂ්පාදන වලින්ය. සත්ව පාලන කටයුතු වල සංවර්ධනයට හා පාලනයට මෑත කාලේ යේදී දූඩි ලෙස රජය අවධානය යොමු කරනු ලැබීය. ඒ අනුව රජය විවිධ කිරි හා කිරි නිෂපාදන සැලසුම් යටතේ කිරි පට්ටි සංවර්ධන ව්‍යාපෘතීන් රාශියක් ආරම්භ කර එහි සංවර්ධනය හා දියුණුව උදෙසා ඒවායේ ක්‍රියාකාරිත්වය වැඩි වශයෙන් පුද්ගලික අංශයේ කළමනාකාරිත්වයට යොමු කරන ලදී. කුඩා පරිමාණ කිරි පට්ටි සංවර්ධන ව්‍යාපෘතීන් රාශියක් ආරම්භ කර එහි සංවර්ධනය හා දියුණුව උදෙසා ඒවායේ ක්‍රියාකාරිත්වය වැඩි වශයෙන්, පුද්ගලික අංශයේ කළමනාකාරිත්වයට යොමු කරන ලදී. කුඩා පරිමාණ කිරි පට්ටි සංවර්ධන ව්‍යාපෘතීන් කුඩා ඉඩම් හිමියන්ට ඉතාම වැදගත් පහසු ආයෝජන මාර්ගයක් වන අතර ඉඩම් නැති වතු කම්කරුවන්ට ද මෙය ඉතාමත් වැදගත් රැකියා සැපයීමේ හා ආදයම් මාර්ගයක් වෙයි. දළ වශයෙන් 5,00,000—6,00,000 පමණ සංඛ්‍යාවක් වශයෙන් සිටින වතු කම්කරුවන් කිරි පට්ටි කර්මාන්ත, සංවර්ධන ව්‍යාපෘතිවල අර්ධකාලීන හෝ පූර්ණ, කාලීනව යෙදිය හැකි බව පෙන්වා දිය හැක. කෙසේ වුවත් ශ්‍රී ලංකා ආර්ථිකයේ පහළ ආදයම් ලබන්නන්ට සැලකිය යුතු වූ ප්‍රයෝජනයක් හා කාර්යක්ෂම ආදයම් මාර්ගයක් වශයෙන් මෙහි ඇති වැදගත් කම ඉතා අධිකය.

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 4,00,000 ක් බව දළ වශයෙන් තක්සේරු කර ඇත. මෙයින් 60%70% දක්වා ප්‍රමාණයක් ගෘහස්ථ පරිභෝජනයට හා දේශීය වෙළඳපොලට ලැබෙයි. ඉතිරි 30%ක පමණ ප්‍රමාණය කිරි මිලදී ගැනීමේ සංවිධානයන් විසින් අයිති කර ගනී. මෙයින් ජාතික කිරි මණ්ඩලය හා නෙස්ලේ වැනි ජාත්‍යන්තර කිරි සකස් කර වෙළඳපලට ඉදිරිපත් කරන ආයතන යන් වැදගත් වෙයි. සාමාන්‍යයෙන් දේශීය වෙළඳ පලට සහ කිරි අලෙවිකරණ මාර්ගයන් වැදගත් වෙයි.

මුලින්ම ගොවිපලේ නිෂ්පාදිත කිරි හෙවත් ''අමු කිරි'' අතරමැදියෙකු හෝ කෙලින්ම විවිධ සේවා සමුපකාර සමිතියක කිරි එකතු කරන මධ්‍යස්ථානය කට හෝ නැත්නම් මෑත කාලීනව බිහි වී ඇති කිරි පට්ටි හිමියන්ගේ සමුපකාර සංගම් සමිතියකට අලෙවි කරයි. එයින් පසු ඒවා පෙවළඳපලට හෝ කිරි සකස් කර අලෙවිකරනු ලබන වෙළඳ ආයතනයකට එයි. මේ ආයතන වලින් සපයන කිරි වලින් 40%ක් ජාතික කිරි මණ්ඩලයට ලැබේ. සාමාන්‍යයෙන් දේශීය නිෂ්පාදන කිරි වලින් වාර්ෂකව ටොන් 20,000 සිට 25,000 ක පමණ කිරි නිෂ්පාදන ආහාර වර්ග නිෂ්පාදනය කරනු ලැබේ. මීට අමතරව රටේ පරිභෝජන අවශ්‍යතාවන් සම්පූර්ණ කර ලීමට ලීටර් 4,00,000 සිට 5,00,000 ප්‍රමාණයක් අ නයනය කරනු ලබයි. මේ අනුව රටේ මුළු කිරි අවශ්‍යතාවයෙන් 25% ක් පමණ අවම වශයෙන් ලංකාවේ නිපදවනු ලැබේ. තක්සේරු ගත සංඛ්‍යා ලේඛණ අනුව ලංකාවේ දෛනික කිරි ඉල්ලුම ලීටර් 8,,00,00000 ක් බව පෙන්වා දෙයි. මේ තත්වයන් මත ආදයම් නම්‍යතාවය කිරි සඳහා 0.6 සිට 0.8 දක්වා ඉල්ලුම් වර්ධනයක් අපේක්ෂා කළහොත් 1990 වන විට දෛනික කිරි ඉල්ලුම ලීටර් මිළියන 1ක් පමණ විය හැකි බව පෙන්වා දිය හැකිය. කෙසේ නමුත් පසුගිය වර්ෂ කීපය තුල කිරි නිෂ්පාදන ආහාර ද්‍රව්‍යයන් සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයන් වැය වූ අතර වාර්ෂිකව එය දල වශයෙන් ඇමරිකන් ඩොලර් මිලියන 25ක් පමණ විය. සාමාන්‍ය යෙන් ලංකාවේ කිරි සඳහා ලැබෙන ගොවිපල මිළ රුපියල් 2.90 සිට 3.46ක් දක්වා ප්‍රමාණයක් වේ. මේ මිල ගණන් එක් කිරි ලිටරයක්සඳහ ජාතික කිරි මණ්ඩලයෙන් ලැබේ. එසේ වුවත් කිරි සඳහා සම්පූර්ණ නිෂ්පාදන වියදම පවුලේ ශ්‍රමය සහ අනෙකුත් සියළුම වියදම් ඇතුළුව එක් ලිටරයක් සඳහා ශත 36 සිට රුපියල් 3.56 දක්වා වෙනස් වන බව බොහෝ සමීක්ෂණ වාර්තාවන් පෙන්වා දෙයි. මෙම තත්වයේ කිරි නිෂපාදනය මෙරටේ වර්ධනයට ප්‍රධාන බාධකයක් වී ඇති බව පෙන්වා දිය හැකිය.

දේශීය මුළු කිරි නිෂ්පාදනයෙන් 60%ක් පමණ ලැබෙන්නේ කඳුරට හා මැදරට ප්‍රදේශයෙන් ආශ්‍ර යෙනි. මෙයට විශේෂ හේතුව වන්නේ මේ ප්‍රදේශ වල ඇති කරනු ලබන උසස් වර්ගයේ යුරෝපීය ගව වර්ග නිසාත් කලාපීය දේශගුණික තත්ත්වයට උචිත ගව වර්ග එම ගව වර්ග බහුල වශයෙන් සත්ව පාලන කටයුතු වලට යොමු කර ගැනීමත් ය.

බටහිර දියුණු සත්ව පාලන පාලන ආර්ථික යන් පවතින රටවලින් මෙරටට ගෙන්වන ලද ''ජර්සි'' ''ෆ්‍රිෂන්'' ''අයර්ෂයර්'' වැනි යුරෝපීය ගව වර්ග වැඩි කිරි නිෂපාදන ප්‍රමාණයක් ලබා දෙයි. එසේ ම මේ ගවයින් වර්ග සඳහා ''බැරෙක්රියා බ්‍රසන්තා, ගිනි තණ නේපියර් වැනි තෘණ වර්ග ආයත කර මෙරට බෝකර හැරීමෙන් මොවුන්ගේ ආහාර සඳහා යොදගැනීමත්, ක්‍රමවත් සහ විද්‍යාත්මක රෝග මර්දනය , ආහාර ද්‍රව්‍ය සැකසීම, වැනි කටයුතු මේ ප්‍රදේශවල ග්‍රාමීය සත්ව පාලන ගොවීන් කරා ලඟා වීමත් මේ ප්‍රදේශවල කිරි නිෂ්පාදනයේ සංවර්ධනයට ඉවහල් වී ඇත. අනිත් අතට දිවයිනේ වියළි කලාපීය ප්‍රදේශවල පශු පාලන කටයුතු සඳහා වැඩියෙන් යොද ගෙන ඇත්තේ ආසියාතික රටවලට සුදුසු සර්ටකලාපීය දේශගුණ රටාවට අනුවර්තනය වූ ගව වර්ගයන්ය. මොවුන් අතර ඉන්දියානු ප්‍රදේශ යන් ජන්ම භූමියකරගත් තර්පකාර්, කන්නායම්, කිලාරි, සහිවාල් සහ සින්දි වැනි ගව වර්ග දනට ලංකාවේ වියළි කලාපීය පරිසර යෝග්‍යතාවයට සුදුසු පරිදි සත්ව පාලන කටයුතු වලට යොද ගෙන ඇත. එසේ වුවත් දනට වියළි කලාපයේ බහුලව සිටින ගව වර්ග නම් දේශීයව පැවැත එන වර්ග හා ඉන්දියානු සින්දි වැනි ගව වර්ග සමග දෙමුහුන් කොට ලබා ගත් සත්ව වර්ගයන්ය. දනට ලංකාවේ සිටින දේශීය එළගවයින් හා ඉහත දක් වූ ඉන්දියා ගව වර්ග දෙමුහුන් කිරීමෙන් මෙරට වියළිකලාපයේ දේශගුණික රටාවට උචිත වර්ග බිහිකර ගත හැකි බව දන් පෙනී ගොස් ඇත. කෙසේ වෙතත් දනට වියළි කලාපයේ වෙසෙන ගව වර්ග වලින් වැඩි කොටසක් ඉන්දියානු සින්දි ගව වර්ගය හා දේශීය ගව වර්ග අඩු ආහාර ප්‍රමාණයකින් හා ශුෂ්ක පරි-සරයක ජීවත් වීමේ හැකියාව මනාව ඇති බැවින් කිරි නිෂ්පාදන ශක්තිය අඩු වුවත් එහි වැදගත් ආර්ථික වටිනාකමක් ඇත්තේ එම සතුන් බර ඇදීම, සී සෑම වැනි කටයුතු වලට වඩා යෝග්‍ය වීමය. අනිත් අතට දේශීය ගව වර්ග, දේශීය තෘණ වර්ග වලින් යැපීමේ ශක්තිය නිසාම මේ ගව පාලන කටයුතු වලට වැය වෙන පිරිවැයද බොහෝ සෙයින් උඩරට ප්‍රදේශවල සත්ව පාලන කටයුතු වලට වැය වෙන පිරිවැයට වඩා අඩු ප්‍රමාණයක් වෙයි. මේ නිසාම උඩරට ප්‍රදේශවල කිරි පට්ටි පාලකයින් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ඉඩම් නොමැති කොටසක් හෙයින් උසස් වර්ගයේ තෘණ වර්ග හා 'අනිකුත් සත්ව ආහාර ද්‍රව්‍යයන් එම සතුන්ට ලබා දීමට අපොහොසත් හෙයින් ඔවුන් එම කටයුතු වලට අධික පිරිවැයක් දරයි. තවද වියළි කලාපයේ මෙන්ම යාපනයේදී මේ සත්ව පාලන කටයුතු පහසුවෙන් කළ හැකි අතර උඩරට හා මැද රට ප්‍රදේශවල මෙන් ඉඩම් ප්‍රශ්න එහිද බලපා තිබේ. කෙසේ වෙතත් මෑත කාලීනව කුරුණෑගල දිස්ත්‍රික්ක යේ කිරි නිෂ්පාදන කටයුතු ඉතා සීඝයෙන් දියුණු වූ බව දක්වේ. එහි කිරි නිෂ්පාදනය 50% පමණ වර්ධනය වී ඇති අතර දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 20,000ක් වෙයි. ඒ සඳහා ලීටර් 1ක් රුපියල් 4.50 බැගින් මිල දී ගන්නා කිරි එකතු කිරීමේ මධ්‍ය මධ්‍යස්ථාන 165ක් එහි පිහිටුවා ඇත.

වෛද්‍ය පර්යේෂණ ආයතනය නිර්දේශ කරන ආකාරයට ශ්‍රී ලාංකිකයෙකුට දෛනිකව අවශ්‍ය කිරි ප්‍රමාණය අවුන්ස 5.5 කි. මේ තත්වයන් මත අවශ්‍ය කිරි ප්‍රමාණය කිසිසේත්ම නොලැබෙන බව බොහෝ සමීක්ෂණ වාර්තා පෙන්නුම් කර දී ඇත. එසේ වුවත් මෙරට කිරි නිෂ්පාදනය ආශ්‍රිත සත්ව පාලන කටයුතු වල සංවර්ධනයට බාධා ඇති කරුණු රාශියක් වේ. අවශ්‍ය තරම් තෘණ වගා බිම් සඳහා ඉඩම් නොමැති වීම, උසස් වර්ගයේ ගවයින් බෝකර ගැනීමේ ගැටළු අනිකුත් සත්ව ආහාර මිල ඉහළ යෑම, සත්ව සෞඛ්‍ය සේවා නිසි පරිදි නොලැබීම හා අලෙවි කරණ ගැටළු ආදීන් පෙන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ සත්ව නිෂ්පාදන අතර ඊලඟට වැදගත්ම ආහාර ද්‍රව්‍යයන් වන්නේ මස්ය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම ගවයන්, එළුවන් ඌරන් සහ කුකුල් පාලනය උපයෝගී කර ගනු ලැබේ. කෙසේ නමුත් ආගමික හා සංස්කෘතික හැදියාවත් හා හුරුපුරුදු මගින් මෙරට මස් මාංශ පරිභෝජනය බොහෝ දුරට සීමා කර ඇත. ලංකාවේ කොළඹ, මහනුවර යාපනය හා ගාල්ල යන නගරවල මස් සඳහා විශේෂ යෙන්ම හොඳ ඉල්ලුමක් සහිත වෙළඳපලක් ඇත. කොළඹ හා මහනුවර නගර වල මස් සඳහා ඇති ඉල්ලුම විශේෂයෙන් ම වියලි කලාපීය ප්‍රදේශ වලින් සපයන ගවයින්ගෙන් සපුරා ගන්නා අතර අනික් ප්‍රදේශවල මස් සඳහා ඇති ඉල්ලුම ප්‍රාදේශීයව ඒ ඒ ප්‍රදේශවලම ඇති සත්ව සම්පතින් පිරිමසා ගනී. සාමාන්‍යයෙන් කොළඹ නගරය තුළ මස් සඳහා ගවයින් රැස් කරන නියෝජිත පුද්ගලයන් 60 පමණ සිටින අතර මස් තොග වෙළඳුන් 14 දෙනෙක් පමණ ප්‍රධාන තොග වෙළඳ කටයුතු වල නිරත වෙයි. මෑත කාලීනව උතුරු නැගෙනහිර පලාත්වල මස්

නිෂ්පාදනය සඳහා ගවයින් අනිකුත් සතුන් ප්‍රවාහනය හා වෙළඳ කටයුතු සැහෙන දුරකට අඩපණ වී ඇත. එයට මූලික හේතුව වූයේ දැනට එම පළාත්වල ඇති අහිතකර වාතාවරණයයි. මේ නිසා මස් මිල ගණන් මෑත කාලීනව ඉතාමත් වැඩි වීමේ ප්‍රවනතාවයන් පෙන්නුම් කරන ලදී. මේ තත්ත්වය තවත් වැදගත් වූයේ උතුරු නැගෙනහිර ධීවර නිෂ්පාදනයන් 80%කින් පමණ පහළ වැටීම නිසා මස් සඳහා හොඳ වර්ධනය වන වෙළඳපලක් ඇති වීමයි. වෛද්‍ය පර්යේෂණ ආයතනය ග්‍රෑම් 14.6 ක් දෛනිකව සත්ව ප්‍රෝටීන් වශයෙන් සාමාන්‍ය පුද්ගලයෙකු ගත ගත යුතු බව පෙන්වා දෙයි. ඒ අනුව ලාභම හා පහසුවෙන් ම මස් මගින් මේ අවශ්‍යතාවය සපුරා ගත හැකි බව පෙන්වා දිය හැකිය. දැනට ලංකාවේ මස් නිෂපාදනය සම්පූර්ණයෙන්ම පාහේ දේශීය ගව වර්ග මත රැඳී පවත්නා බැවින් එය දියුණු තත්ත්වයකට පත්කළ හැකිය. අනික් අතට විශාල වශයෙන් මස් ආයාත නොකිරීම ද මේ කර්මාන්තයේ වර්ධනයට බොහෝ දුරට ඉවහල් විය හැකිය. තවද සාමාන්‍යයෙන් දේශීය වෙළඳ පලට වාර්ෂිකව ගවයින් 2,00,000ක් පමණ මස් සඳහා ලැබෙන බව තක්සේරු කළ හැකිය. මෙයින් තොග වෙළඳපලට එන සාමාන්‍ය ප්‍රමාණයේ දේශීය ගවයෙකුගෙන් ඇට රහිත මස් කිලෝ ග්‍රෑම් 40ක් පමණ ලබා ගන්නා බව වෙළඳපල සමීක්ෂණ වලින් හෙළි වී ඇත. මේ අනුව වර්තමානයේ වාර්ෂිකව මස් ටොන් 9,000ක් පමණ නිෂ්පාදනය වන අතර එහි වටිනාකම දළ වශයෙන් පවතින මිල ගණන් වලට අනුව රුපියල් දශ ලක්ෂ 270ක් පමණ වේයයි තක්සේරු කර තිබේ. එසේ වුවත් මෑත කාලීනය උතුරු නැගෙනහිර අහිතකර දේශපාලන වාතාවරණය නිසා කොළඹ නගරයේ දෛනික මස් නිෂ්පාදනය හා සැපයුම මෙට්‍රික් ටොන් 9 දක්වා අඩු වී ඇති අතර සාමාන්‍යයෙන් එය දෛනික මෙට්‍රික් ටොන් 1.5 දක්වා වුව ද අඩුවෙයි. කොළඹ නගරයට මස් සඳහා ගවයින් සපයන ප්‍රදේශ අතර නොච්චියාගම නාච්චිදූව, අනුරාධපුරය, කහටගස්දිගිලිය, පොලොන්නරුව, ත්‍රිකුණාමලය, වැනි නගර ප්‍රධාන තැනක් ගනී·

මස් සඳහා සුදුසු ගවයින් බොහෝ විට ගම් මට්ටමින් එකතු කරනු ලබයි. ඔවුන් තොග වෙළඳුන්ට බාර දීමෙන් පසු එම සතුන් නගර කරා ගෙන එයි. තවද සාමාන්‍ය යල හා මහ කන්න වගා කටයුතු ආරම්භ වන විට සතුන් ලබා ගැනීම දුෂ්කර වන්නේ සතුන් සී සෑම වැනි කටයුතු සඳහා බහුල ලෙස යොදා ගන්නා බැවිනි. මස් සඳහා ලබා ගන්නා ගවයෙකුගේ සාමාන්‍ය මිල රුපියල් 800ක් පමණ වන අතර ඔවුන් දුම්රියෙන් හෝ ලොරි මගින් ප්‍රවාහනය කරනු ලබයි. ප්‍රවාහනයේදී එක් සතෙකුට වියදම රුපියල් 40 සිට 80 දක්වා ප්‍රමාණයන් දුර අනුව වෙනස් වේ. මේ තත්ත්වයන් මන කෙසේ වෙතත් වාර්ෂිකව අවම වශයෙන් මස් ටොන් 25,000 ක් වත් පරිභෝජනයට යොදා ගන්නා බව පෙනී යයි.

ලංකාවේ මස් නිෂ්පාදනය කෙරෙන අංශවල, වර්ධනයට බාධා වී ඇති ඇති කරුණු අතර තත්වයෙන් හා ප්‍රමාණයෙන් උසස් වර්ගයේ මස් නිෂ්පාදනය නොවීම, අඩු ගොවිපල මිලක් ලැබීම, මේ යටතේ සිල්ලර මිලෙන් 40%ක් ගොවිපල මිල වශයෙන්ලැබීම, ආගමික හැඟීම් හා හෙංචි සහ වෙනත් නීතිමය බාධක සහ මස් සඳහා අලෙවිකරණ වියදම අධික වීම ආදිය මෙහිලා ප්‍රධාන බව පෙන්වා දිය හැකිය.

සංවර්ධනය වූ රටවල කුකුල් මස් ඉතා පහසුවෙන් ලබා ගත හැකි පොදු වේ මිල අඩු ආහාර වර්ගයක් වුවත් ලංකාවේ එය තවමත් සුඛෝපභෝගී ආහාර ද්‍රව්‍යයෙහිලා සැලකේ. මස් හා බිත්තර සඳහා කුකුල් පාලන කටයුතු නැංවීම කෙරේ ඉමහත් ප්‍රයත්නයක් රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය දැරුවත් මේ සත්ව පාලන අංශය ක්‍රමවත් දියුණුවක් තවම ලබා ගෙන නැත. මේ සඳහා විශේෂයෙන්ම බලපෑවේ ආගමික හා සංස්කෘතික හේතූන් , ශිල්පීය හා තාක්ෂණික දැනුමේ මදකම , අලෙවි දුෂ්කරතාවන් හා සත්ව ආහාර වල අධික මිල ගණන් ආදියයි. 1982 සත්ව පාලන සංඛ්‍යා ලේඛණ වලට අනුකූලව දැනට ලංකාවේ දශ ලක්ෂ 6.3 ක් කුකුළන් හා තාරාවුන් ඇති බව පෙන්වා දී ඇත. මෙයින් 60% කටත් වඩා වැඩි ප්‍රමාණයක් බටහිර වෙ රළ බඩ, කොළඹ නගරය හා ආශ්‍රිත ප්‍රදේශ වලත්, දකුණු ප්‍රදේශයත්, උතුරින් යාපනය අර්ධද්වීපයේත් සිටින බව පෙන්වා දී ඇත. කුකුල් පාලන අංශයේ මස් හා බිත්තර පිළිබඳ ප්‍රධාන අංශ දෙකක් හඳුනා ගත හැකිය. එනම් වාණිජ වශයෙන් ව්‍යාපාරික පාරිමාණයකින් කෙරෙන තරමක් විශාල ගොවිපලවල් සහ ග්‍රාමීය වශයෙන් සුළු පරිමාණ කුකුල් පාලන කටයුතු වල නිරතවන අංශය ලෙසයි. ව්‍යාපාරික වාණිජ අංශයේ උසස් වර්ගයේ කුකුලන් බෝ කිරීම හා වාණිජ වශයෙන් වෙළඳ පලට නිෂ්පාදන සැපයීම කෙරේ. දේශීය ග්‍රාමීය අංශයේ දී දේශීය කුකුලන් ඇති කිරීම

ග්‍රාමීය හා ගෘහස්ථ අවශ්‍යතාවයන් සපුරාලීමට කට යුතු කරයි. ලංකාවේ දනට ඇති කරනු ලබන ජනප්‍රිය වර්ග ලෙසට "වයිට් ලෙගෝන්" බ්‍රවුන් ලෙගෝන්" රෝඩ් අයිලන්ඩ් රෙඩ් සහ වයිඩ්, ලයිට් සසෙක්ස්, කෝනිස්, වයිට් රොක්, ඕස්ට්‍රලෝප් වැනි වර්ග වැදගත් වේ. බ්‍රොයිලර් හෙවත් කුකුල් මස් නිෂ්පාදනයේ දී ඉතා වැදගත් වන්නේ සමේ වර්ණයයි. සුදු පිහාටු වලින් —යුක්ත සමක් සහිත සතුන් කුකුල් මස් පරිභෝජකයන් අතර ජනප්‍රිය බවට පත් වී ඇත. ලාංකිකයන්ගෙන් වැඩි වශයෙන් කුකුල් මස් පරිභෝජනය කරන්නේ ඉහළ ආදායම් ලබන කණ්ඩායමයි. ඔවුන් වැඩි ප්‍රමාණයක් කය වෙහෙසා වැඩ කරන්නන් නොවන බැවින් අඩු ශක්තිය ප්‍රසාණයක් ඇති මස් වර්ගය වඩාත් යෝග වේ. ග්‍රාමීය හා නාගරික අංශවල කුකුල් මස් ඉල්ලුම සසඳා බලන විට නාගරික අංශයේ මස් ඉල්ලුම ඉතාම ඉහළ අගයක් ගන්නා බව පෙන්වා දිය හැකිය. කොළඹ කුකුල් මස් වෙළඳපලට මස් ඉල්ලුම සපුරාලීම සඳහා විශේෂයෙන්ම පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ප්‍රදේශවල පිහිටි සත්ව ගොවිපලවල් වඩාත්ම වැදගත් වේ. විශේෂයෙන්ම බිංගිරිය, හලාවත, මීගමුව, පස්යාල, මාරවිල, දුම්මලසූරිය, මාදම්පේ වෙන්නප්පුව නාත්තන්ඩිය හා අවිස්සාවෙල්ල වැනි ප්‍රදේශ වැදගත් වේ. මීට අමතරව කොළඹ නගරය අවට දෙහිවල කොට්ටාව, නුගේගොඩ වැනි ප්‍රදේශවල මධ්‍යම පරිමාණයේ කුකුල් ගොවිපලවල් සෑහෙන ප්‍රමාණයක් වෙළඳ පලට සැපයුම් කරයි. සත්ව පාලනයෙන් දියුණු රටවල කුකුල් මස් වෙළඳපලට එන්නේ "සකස් කරන ලද මස්" ලෙසින් ය, ඒවා සඳහා හොඳ ඉල්ලුමක් ඇත. ලංකාවේ සකස් කරන ලද මස් අලෙවිය එතරම් දියුණු තත්ත්වයකට පත් වී නැත. එසේ වුවත් මෑත කාලීනව වෙළඳපලට එළි වූ නව සත්ව පාලන ගොවිපලවල් ඇතැම් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරන සමාගම් මේ තත්ත්වය වෙනස් කරමින් සකස් කරන ලද මස් වෙළඳපලට එවනු ලබයි. මේ සඳහා මූලික බාධකය වී ඇත්තේ අවශ්‍ය තාක්ෂණික හා උපකරණ පිළිබඳ ප්‍රශ්නයයි. කුකුල් මස් වෙළඳපලට සැපයීමේ දී එයින් 60%ක් පමණ අළුත් කුකුල් මස් වලට හිමි වී ඇත. දේශීය වෙළඳපලට කුකුල් මස් සැපයුමෙන් 75%ක් පමණ ග්‍රාමීය ප්‍රදේශවල කුකුල් පාලන මධ්‍යස්ථාන වලින් හා කුඩා ගොවිපල වලින් ලැබේ. කොළඹ නගරයේ කුකුල් මස් වෙළඳපලට දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් සතුන් ගෙන එනු ලැබේ. මෙයින් 50% පමණ අතර මැදි ව්‍යාපාරිකයන් හා කුකුලන් එකතු කරන්නන් ගෙන ඇති අතර තවත් 25%ක් කෙලින්ම නිෂ්පාදනකයාගෙන් අලෙවි කරන වෙළඳුන් මිලදී ගනී. ඉතිරි 25% සාමාන්‍ය ගොවිපල හිමියන් විසින් කරන අලෙවිකරන කටයුතු හා ඔවුන්ගේ පරිභෝජන කටයුතු වලට යොදා ගනී. කෙසේ නමුත් මුළු කුකුල් මස් නිෂ්පාදනයෙන් 40% ක් කෙලින්ම වෙළඳපලට සැපයෙන අතර, දළ වශයෙන් තක්සේරු කලහොත් දෛනිකව කිලෝ ග්‍රෑම් 4,500 ක් වෙළඳ පලට එයි.

කුකුල් පාලනයේදී මස් නිෂ්පාදනයට වඩා වැදගත් වන්නේ බිත්තර නිෂ්පාදනයයි. ලංකාවේ බිත්තර සඳහා වූ වෙළඳපල කටයුතු තරමක් දුරට වර්ධනය වූ උපනතියක් පෙන්නුම් කරයි. 1982 වන විට වාර්ෂික බිත්තර නිෂ්පාදනය දශ ලක්ෂ 521 කි. දේශීය වෙළඳ පලට ලැබෙන බොහොමයක් බිත්තර දළ වශයෙන් 75%කටත් වඩා ප්‍රමාණයක් මධ්‍යම හා විශාල පරිමාණයේ කුකුල් පාලන ගොවිපලවලින් ලැබේ. ඉතිරි 25%ක පමණ ප්‍රමාණය කුඩා පරිමාන ග්‍රාමීය හා අනෙකුත් ප්‍රාදේශීය සත්ව පාලන ව්‍යාපෘති වලින් ලැබේ. බිත්තර සඳහා ප්‍රධාන නගර වල මෙන්ම කොළඹ නගරය තුළ ද ඉතාමත් හොඳ දියුණුවන වෙළඳපලක් දැකිය හැක. විශේෂයෙන්ම කොළඹ නගරයට ලැබෙන බිත්තර ප්‍රමාණය දළ වශයෙන් දෛනිකව ලක්ෂ 1ක් පමණ වෙයි. මෙවායින් වැඩි ප්‍රමාණයක් බටහිර වෙරළබඩ ප්‍රදේශය හා පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ප්‍රදේශ වූ බිංගිරිය, හලාවත මීගමුව, දුම්මලසූරිය, මාරවිල, පස්යාල වෙන්නප්පුව, නාත්තන්ඩිය, පිළියන්දල සහ බේරුවල වැනි ප්‍රදේශවල විශාල හා මධ්‍යම ප්‍රමාණයේ කුකුල් ගොවිපල වලින් ලැබේ. ඊට අමතරව නුගේගොඩ කොට්ටාව, දෙහිවල සහ ගල්කිස්ස වැනි කොළඹ නාගරිකය අවට ප්‍රදේශවලින් ද සෑහෙන කොටසක් වෙළඳපලට ලැබේ. කොළඹ මෙන්ම අනෙක් ප්‍රධාන නගර කීපයකම බිත්තර සඳහා හොඳ ඉල්ලුමක් සහිත වෙළඳ පලක් ඇත. යාපනය , අනුරාධපුරය කුරුණෑගල, මහනුවර, මාතර හා ගාල්ල යන නාගරික ප්‍රදේශ එයින් ප්‍රධාන වේ. ඒවායේ බොහොමයක් අවශ්‍යතා ඒ ඒ ප්‍රදේශ වලින්ම සපුරා ගන්නා අතර සමහර විට කොළඹ තොග වෙළඳ පලින් ද තොග රැගෙන යයි. බිත්තර සඳහා හොඳ ඉල්ලුමක් ඇත්තේ විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සංචාරක ආයතන , ආපන ශාලා නිවාඩු නිකේතන, රෝහල් සහ වෙනත් රාජ්‍ය සහ පුද්ගලික

ව්‍යාපාරයන් ආශ්‍රය කරගෙනය එසේම නාගරික ප්‍රදේශවල ගෘහස්ථ පරිභෝජනය සඳහා ද හොඳ ඉල්ලුමක් බිත්තර සඳහා ඇත. තවද දේශීය ධීවර නිෂ්පාදනවල පිරිහී යාම සහ අධික මිල ගණන් නිසා බිත්තර සඳහා ඉතා අධික ඉල්ලුමක් මෑත කාලීනව වෙළඳපලේ දක්නට ඇත. බිත්තර මිල සාමාන්‍යයෙන් දෙසැම්බර් ජනවාරි මාසත්, අප්‍රේල් මැයි මාසවලත් සාමාන්‍ය මිල මට්ටමට වඩා වැඩියෙන් පවතින්නේ උත්සව සමය හේතු කොට ගෙනය. එසේ වුවද මේ අංශයේ නිෂ්පාදනයන් තවමත් රටේ සම්පූර්ණ අවශ්‍යතාවයන් සපුරා ලීමට ප්‍රමාණවත් පරිදි වර්ධනය වී නැති බව මෙහිලා සඳහන් කල හැකිය.

කුකුල් පාලන කර්මාන්තයට එලඹෙන සහ දැනට පවත්වා ගෙන යන විශාල, මධ්‍යම හා සුළු පරිමාණයේ සත්ව නිෂ්පාදකයින්ට ඇතිවන දහසක් බාධක දුෂ්කරතාවයන් හා ගැටළු අභිබවා යහපත් අනාගතයකට පත්විය හැකි බව පෙන්වා දිය හැකිය. මේ සඳහා ප්‍රධාන හේතුව වන්නේ, මෙම නිෂ්පාදන ද්‍රව්‍යයන් සඳහා වෙළඳ පලේ ඇති වර්ධනය වී ඇති හා වර්ධනය වන ඉල්ලුම් තත්ත්වයයි. මෑතකාලීනව මෙරට කුකුල් පාලන කර්මාන්තයේ කිසිම විටෙක ලංකාවට අවශ්‍ය බිත්තර හා කුකුල්මස් ඉල්ලුම් ප්‍රමාණයට සරිලන සේ සැපයීමට නිෂ්පාදකයින්ට නොහැකි විය. මේ තත්ත්වය කෙතරම් උග්‍ර වී ද යන්න වෙනත් රටවලින් කුකුල්මස් ආනයනය කිරීමට සිදු වී මෙන් ඒ බව පැහැදිලි වේ.

සත්ව නිෂ්පාදන අතුරින් ශ්‍රී ලංකාවේ ඊළඟට වැදගත් සත්වනිෂ්පාදන අංශ වන්නේ එළුවන්, බැට හා ඌරු පාලනයයි. 1982 සංඛ්‍යා ලේඛණ වලට අනුව දේශීය ව ඇති කරනු ලබන එළුවන් සංඛ්‍යාව 5,12,000 ක් බව ගණන් බලා තිබූ අතර එම කාර්යයේ යෙදී සිටි ගොවීන් සංඛ්‍යාව 90,000 ක් පමණ විය. එළු පාලනය බහුල වශයෙන්ම යාපනයත්, වියළි කලාපයේ බොහෝ ප්‍රදේශ හා පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ප්‍රදේශවලත් බහුල වශයෙන් සිදු කෙරේ. එළු පාලනය සඳහා විශාල මූල ධනයක් වැය නොවන අතර ලඳුකැලෑ හා තණ බිම් ආශ්‍රිතව මේ කටයුත්ත පහසුවෙන් කළ හැකි වේ. උඩරට කලාපයේ එළුවන් පාලනය කිරීම දුෂ්කර වී ඇත්තේ ශීත පුළඟ ඔවුන්ට එතරම් සුදුසු නොවන නිසායි. එළු මස් හා එළු කිරි සඳහා වෙළඳ පල ඉතා වැදගත් මෙන්ම ඉතා විශාල වුවත් අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මේ දෙවර්ගයේම නිෂ්පාදනයක් නොවේ. සාමාන්‍යයෙන් එළු දෙනකගේ දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 1–1½ ක් පමණ වෙයි. තවද තක්සේරු ගත සංඛ්‍යා ලේඛණ අනුව වාර්ෂිකව එළුවන් 3,00,000ක් පමණ මස් සඳහා යොදා ගන්නා බව පෙන්වා දී ඇත. මස් සඳහා යොදා ගන්නා සාමාන්‍ය එළුවකුගේ බර කිලෝ ග්‍රෑම් 12–15 ක් පමණ වන අතර වයස අවුරුදු 2–4 ක් පමණ වෙයි. දැනට ලංකාවේ ඇති කරනු ලබන එළුවන් වර්ග අතර ජම්පනාරී, යාපනය වර්ගය, කොට්ටුකච්චිය වර්ගය ප්‍රධාන වේ. ඊට අමතරව "බෝර්" යන වර්ගය මස් සඳහාත්, "සනාන්" යන වර්ගය කිරි සඳහාත් මෙරට විශේෂයෙන් ඇති කරනු ලබයි. කෙසේ වෙතත් එළුමස් සඳහා හොඳ වෙළඳපලක් අගනුවර පවතී. මේ වෙළඳ පලේ ඉල්ලුම් තත්වයට සරිලන ප්‍රමාණවත් නොවන අයුරින් යාපනය, වව්නියාව මන්නාරම, පුත්තලම, මඩකලපුව හා මුලතිව් යන ප්‍රදේශ වලින් එළුවන් සපයයි.

ශ්‍රී ලංකාවේ සත්ව සම්පතින් තවත් වැදගත්, තත්වයක් උසුලන්නේ ඌරු සහ බැටළු පාලනයයි. 1982 වන විට බැටළුවන් 30,000 ක් පමණ යාපනය කුරුණෑගල හා පුත්තලම යන ප්‍රදේශවල ඇතිකරන ලද අතර ඌරන් 90,000ක් පමණ ප්‍රධාන වශයෙන්ම බටහිර වෙරළබඩ ප්‍රදේශවල ඇතිකරන ලදී. මේ සත්ව පාලන අංශ දෙකම පොදුවේ සංවර්ධනයට ඉමහත් හැකියාවන් ඇත. එසේ වුවත් මේ සත්ව පාලන කටයුතු දෙකම තවම ත් ප්‍රාථමික අවධියේ පසුවේ. ඌරුමස් සඳහා විශේෂයෙන්ම හොඳ වෙළඳපලක් මෙරට පවතී. එසේ වුවත් මස් සකස් කරන තාක්ෂණික ක්‍රම හා පහසුකම් තවමත් මෙරට ප්‍රමාණවත් පරිදි සංවර්ධනය වී නැත. මේ අනුව සාමාන්‍ය සත්ව පාලන කටයුතු වලදී ඇති වී ඇති බාධක ගැටළු මේ කර්මාන්ත දෙක තුළ සංවර්ධනයට පොදුවේ බලපෑ ඇති බව පෙන්වා දිය හැකිය.